# හවුල් ව්‍යාපාර ආරම්භ කළයුත්තේ කෙසේද?

ජී.ජේ.කේ. ආරියදාස ජයවර්ධන
අධ්‍යක්ෂ
කාර්මික තාක්ෂණවේදී
තොරතුරු සේවා මධ්‍යස්ථානය

වර්තමානයේ තනි තනිව ව්‍යාපාර ආරම්භ කිරීම මෙන්ම පවත්වාගෙන යන ව්‍යාපාරයක් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ආයෝජන සිදු කිරීම බොහෝ විට අපහසුවේ. ඒ සඳහා හවුල් ආයෝජන මත ව්‍යාපාර පවත්වාගෙන යාමට බොහෝ ව්‍යාපාරිකයෝ පෙළඹී සිටිති. මෙය නූතන ව්‍යාපාර අවශ්‍යතාවයන් මත යෝග්‍ය වුවද, ව්‍යාපාරයේ සුරක්ෂිතභාවය හානිවීම මෙන්ම අනාරක්ෂිතභාවය සඳහාද හේතුවී ඇති අවස්ථා දුලබ නොවේ.

එසේ වුවද හවුලේ ආරම්භකර පවත්වාගෙන යන ව්‍යාපාරයක් නීත්‍යානුකූල හවුල් ගිවිසුමක් පදනම් කරගෙන පවත්වාගෙන යන්නේ නම් එබඳු තත්ත්වයක් ඇතිවීම වලක්වාගෙන හොඳින් කළමනාකරණය කළ හැකිවේ. ඒ සඳහා හවුල් ගිවිසුම මගින් ව්‍යාපාරයේ සියළුම හවුල්කරුවන් නීත්‍යානුකූලව බැඳී සිටීම ඊට හේතුවී ඇත.

හවුල් ව්‍යාපාරයක අයිතිය එම ව්‍යාපාරයේ හවුල්කරුවන් සතුවන අතර, එකිනෙකාගේ කැමැත්ත විමසා සියළුදෑ කිරීම අත්‍යාවශ්‍ය වේ. යම් හවුල්කරුවකුගේ අයිතිය ඔහුගේ කැමැත්ත මත වෙනත් අයෙකුට පවරන්නේ නම් ඒ සඳහා අනෙක් හවුල්කරුවන් විමසා කැමැත්ත ඒකමතිකභාවය මත පැවරීම සිදුකළ හැකිවේ.

හවුල් ව්‍යාපාරයක් යනු පුද්ගලයන් අතර, පවත්වාගෙන යනු ලබන පොදු ව්‍යාපාරික අරමුණු මත පදනම් වූ කාර්යයකි. 1890 ආඥා පණතේ 1 වැනි වගන්තියෙන් සඳහන් වන්නේ " හවුල් ව්‍යාපාරයක් යනු ලාභ ලැබීමේ අරමුණ ඇතිව පොදුවේ පවත්වාගෙන යන පුද්ගලයන් අතර සබඳතාවයන්" යනුවෙනි. ඒ අනුව ලාභ ලැබීමේ මූලික පරමාර්ථය ඇතිව පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වේ. තනි පුද්ගල ව්‍යාපාරයක, ව්‍යාපාරයේ සියළුම වත්කම් බැරකම් වගකීම, ව්‍යාපාරය සතු පුද්ගලයා මත පැවරෙන අතර, හවුල් ව්‍යාපාරයක වගකීම සියළුම හවුල්කරුවන් සතුවේ. සාමූහිකවද වගකීම දැරීමට බැඳීසිටි. උදාහරණයක් ලෙස යම්කිසි හවුල් ව්‍යාපාරයකට බැංකු ණය මුදලක් ලබාගෙන යම්කිසි හේතුවක් මත ව්‍යාපාරය බංකොලොත් භාවයකට පත්ව එම ණය මුදල ආපසු ගෙවීමට තත්ත්වයක් එම ව්‍යාපාරයට නොමැති අවස්ථාවක හවුල්කරුවෝ සිය පෞද්ගලික දේපලවලින් වුවද ණය ගෙවීමට නීත්‍යානුකූලව බැඳී සිටිති. හවුල් ව්‍යාපාරයක බැරකම් සඳහා හවුල්කරුවන්ගේ වගකීම අසීමිතවන අතර, සියළුම හවුල්කරුවන් ඒ සඳහා වගකීම අනිවාර්ය වේ. හවුල් ව්‍යාපාරයක අසීමිත වගකීම පැහැරහරිනු ලබන අවස්ථාවක ව්‍යාපාරයට නොව නඩු පවරනු ලබන්නේ පුද්ගලයාටයි. සමාගමකට මෙන් හවුල් ව්‍යාපාරයකට නෛතික පුද්ගල භාවයන් සඳහා නීතිමය වශයෙන් ඉඩකඩ සලසා නොමැති වීම ඊට හේතුවී ඇත. හවුල් ව්‍යාපාර ආරම්භකර පවත්වාගෙන යාමේදී ඉහත පැහැදිලි කළ නීතිමය අවස්ථා පිළිබඳව විශේෂයෙන්ම කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත නිෂ්පාදන ආයතන, වෙළඳ ව්‍යාපාර සැලකිලිමත්වීම අත්‍යාවශ්‍ය කරුණකි.

## හවුල් ව්‍යාපාරයක වාසි

- හවුල් ව්‍යාපාරයක් ආරම්භයේදී ව්‍යාපාර ප්‍රාග්ධනය මුදලින් හෝ ඊට සමාන ප්‍රාග්ධන වත්කමක්, දේපලක් මගින් යෙදීමට හැකිවීම.

- ප්‍රාග්ධනය වෙනස් කිරීමට හැකිවීම, අළුතින් ප්‍රාග්ධනය යොදවන හවුල්කරුවකු සියළුම හවුල්කරුවන්ගේ ඒකමතිකභාවය මත බඳවා ගැනීමට හැකිවීම.

- ගිණුම් වාර්තා තැබීම හා විගණනය අනිවාර්ය නොවීම.

- හවුල් ව්‍යාපාරය නමින් බදු ගෙවීම අනිවාර්ය නොවීම.

- බදු ගෙවීම හවුල්කරුවන්ට කළ හැකිවීම.

- හවුල් ව්‍යාපාරයක් 1918 අංක: 6 දරණ ව්‍යාපාර ආඥා පනත සහ 1987 අංක: 7 දරණ ව්‍යාපාර නාම සංශෝධන පණත අනුව හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචිය සරලව කළ හැකිවීම.

- රු. 1000 ට වැඩි වටිනාකමකින් යුත් හවුල් ව්‍යාපාර ලිඛිත ගිවිසුමක් යටතේ සාර්ථකව පවත්වාගෙන යා හැකිවීම.

## හවුල් ව්‍යාපාරයක අවාසි

හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී ඇතිවිය හැකි අවාසිදායක තත්ත්වයන් පහත සඳහන් අයුරින් විග්‍රහ කළ හැකිව ඇත.

- හවුල් ව්‍යාපාරයක වගකීම අසීමිත බැවින්, ව්‍යාපාරය බංකොලොත් වූ අවස්ථාවක පෞද්ගලික වත්කම්, දේපල වලින් වුවද වගකීම් ඉටුකිරීමට බැඳී සිටීම.

- හවුල් ව්‍යාපාරයකට නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම ඕනෑම නීතිමය අවස්ථාවකදී හවුල්කාර පුද්ගලයන්ගේ නමින් නීත්‍යානුකූල නීතිමය පියවර ගැනීමට හැකිවීම.

- හවුල් ව්‍යාපාරයකට අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම. සමාගමක් මෙන් නොව එක් හවුල්කරුවෙකු මියයාම, උමතුවීම, වැනි හේතූන් මත හවුල් ව්‍යාපාර විසුරුවා ගැනීමට හැකියාව ඇත.

- හවුල්කරුවන් සංඛ්‍යාව සීමිත වීම. එනම් හවුල් ව්‍යාපාරයක අවම හවුල්කරු සංඛ්‍යාව දෙදෙනෙක් වන අතර, උපරිම සංඛ්‍යාව හවුල්කරුවන් 20 කි. නමුත් සමාගමකට කොටස්කරුවන් ඕනෑම සංඛ්‍යාවක් එම සමාගමේ පරමාර්ථ අරමුණු අනුව, තීරණය කිරීමට හැකිවේ.

**හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ වාසි අවාසි සියළු කරුණු සැලකිල්ලට ගත්විට හවුල් ව්‍යාපාරයක් ආරම්භකර සාර්ථකව පවත්වාගෙන යාමට ඉතාමත්ම වැදගත් වන්නේ ව්‍යාපාර ආඥා පණත යටතේ ව්‍යාපාර නාම ලියාපදිංචියත් සමග හවුල් ව්‍යාපාර ගිවිසුමක් මත ව්‍යාපාර කටයුතු කිරීමය.**

## හවුල් ව්‍යාපාර ගිවිසුමක් සැකසීම

හවුල් ව්‍යාපාර ගිවිසුමක් සැකසීම හා එය ඔප්පුවක් ලෙස ලියාපදිංචි කිරීම නීතිඥ හෝ නොතාරිස් මහතෙකු මගින් කරවා ගැනීම අත්‍යාවශ්‍ය වේ. එවැනි ගිවිසුමක් සැකසීම සම්බන්ධ හවුල්කරුවන් දැනුවත්ව සිටීම සහ අවබෝධය ඒ සඳහා වැදගත්ය. ඒ සඳහා එක් එක් හවුල්කරුවන්ට හවුල් ව්‍යාපාරයේ ඉටු කළයුතු කාර්යයන් නිශ්චිතව හඳුනාගැනීම අත්‍යාවශ්‍ය වේ. හවුල්කරුවන් ඔවුනොවුනගේ හැකියාවන් සහ සම්බන්ධතා සැලකිල්ලට ගෙන ඒ ඒ කාර්යයන් සතු වගකීම ඉටුකිරීමට ගිවිසුම්ගතව ක්‍රියාකරන්නේ නම්, ඕනෑම ව්‍යාපාරයක් සාර්ථකව නීත්‍යානුකූල ගිවිසුම මගින් සුරක්ෂිතවනවා පමණක් නොව අනිසි ඵලප්‍රයෝජන එක් එක් හවුල්කරුවන්ට ලබා ගැනීමට අවස්ථාව නොසැලසේ.

## ගිවිසුම්ගත විය යුතු කාර්යයන්

- ව්‍යාපාරයේ පරිපාලනය එනම් අවශ්‍ය සේවකයින් බඳවා ගැනීම පුහුණු කිරීම, සේවක වැටුප් ගෙවීම, කාර්යාලය පවත්වාගෙන යාම, සේවකයින් ප්‍රතිලාභ, සේවකයින්ගේ විනය, අස්කිරීම වැනි සියළු පරිපාලන ක්‍රියාකාරකම් එක් හවුල්කරුවෙක් ගේ වගකීමට යටත්වන ලෙස ගිවිසුම් කොන්දේසි අන්තර්ගත කිරීම

## අලෙවිකරණ කටයුතු පරිශීලනය

- ❑ ව්‍යාපාරයේ ඉටු කරන භාණ්ඩ නිෂ්පාදනය හෝ සේවා හඳුනාගැනීම, ඉලක්ක ගත කිරීම භාණ්ඩ හා සේවා බෙදාහැරීම, අලෙවිය ඇතුළු සියළු නිෂ්පාදන හා අලෙවිකරණ කටයුතු වගකීම ගිවිසුම්ගත කොන්දේසිවලට අන්තර්ගත කළ හැකිවීම. ව්‍යාපාරයේ ස්වභාවය හා හවුල්කරුවන්ගේ සංඛ්‍යාව අනුව මෙම වගකීම හවුල්කරුවන් දෙදෙනෙකුට වුවද පැවරීම කළ හැකිවේ.

- ❑ ව්‍යාපාරයේ මූල්‍ය පරිපාලනය හා කළමණාකරණය. දෛනික මුදල් පාලන කටයුතු, බැංකු ගිණුම් පවත්වාගෙන යාම, චෙක්පත් අත්සන් කිරීම වැනි මුදල් පරිහරණය පිළිබඳව නිශ්චිත කොන්දේසි ගිවිසුමට අන්තර්ගත කිරීම.

## නීතිමය අයිතිය පිළිබඳ කරුණු

- ව්‍යාපාරයේ හවුල්කරුවකු සිය වගකීම අයත් කොන්දේසියක් කළ අවස්ථාවකදී අනෙක් හවුල්කරුට හෝ හවුල්කරුවන්ට ගැනීමට හැකි නීතිමය පියවර පිළිබඳ කොන්දේසි අන්තර්ගත කිරීම

ඉහත සඳහන් කොන්දේසි ප්‍රකාර හවුල් ව්‍යාපාර ගිවිසුමක් මගින් විශ්වාසය හා සුරක්ෂිතභාවය ගොඩනගා ගන්නා හවුල් ව්‍යාපාරයක් එකිනෙකාගේ වගකීම සාමූහිකභාවයකින් යුතුව ඉටුකරන්නේ නම් හවුල් ව්‍යාපාර සාර්ථකව කළ හැකිවේ. යම්කිසි පලාතය කළ නොහැකි හේතුවක් මත ව්‍යාපාරය හානි ලබා බංකොලොත් තත්වයකට පත්වුවද, සියළුම හවුල්කරුවන්ට අපහසුතාවයකින් තොරව එයට මුහුණදීමටද එමගින් හැකිවන බව අවසන් වශයෙන් පෙන්වා දීමට පුළුවන.

*(මෙම ලිපිය 1890 හවුල් ව්‍යාපාර ආඥා පණත 1982 සමාගම් පනත 1918, 1987 ව්‍යාපාර පණත් ඇසුරින් සකසන ලද්දකි.)*